VICTORIA State Government | Education and Training

# නෙරපීම සම්බන්ධ ක්‍රියාපටිපාටිය

## ඔබගේ දරුවාව නෙරපා දැමීමෙන් පසු දෙමාපියන්* හට තොරතුරු

සිසුවාගේ අදාල පුද්ගලයා හට මෙම පොත් පිංච, හැසිරීම් සමාලෝචන සම්මන්ත්‍රනයේදී ලබාදිය යුතුය.

මෙම පොත්පිංච මගින් සිසුන් සහ ඔවුන්ගේ අදාල පුද්ගලයා හට පහත තොරතුරු ලබාදේ:

- ඔබගේ දරුවාව නෙරපීම සම්බන්ධයෙන් යම් ගැටළුවක් ඇතිනම් කලයුතු දේ
- නෙරපා හැරීම ක්‍රියාත්මක වීමෙන් මෙන් පසු සිදුවන දේ
- වැඩිදුර තොරතුරු සහ උපකාර සඳහා යායුතු ස්ථාන

නෙරපීමේ ක්‍රියාවලිය සම්බන්ධ, කාර්යභාරය සහ වගකීම් ඇතුලත්, අමතර තොරතුරු සඳහා සහ නෙරපීමට පෙර ඔබ විසින් අපේක්ෂා කල හැකි දේ සඳහා www.education.vic.gov.au/school/parents/behaviour/Pages/faqs.aspx වෙබ් අඩවිය බලන්න.

### මාගේ දරුවාව පාසැලෙන් නෙරපා ඇත. මෙයින් කුමක් අදහස්වේද?

නෙරපා දැමීම යනු සිසුවෙකුව දැනට ඇතුලත්කර ඇති පාසැලෙන් ස්ථිර වශයෙන්ම බැහැර කිරීමේ ක්‍රියාවලියයි.

සිසුවෙකුව තමාව දැනට ඇතුලත්කර ඇති පාසැලෙන් ස්ථිරවම නෙරපා දැමීම විදුහල්පතිවරයෙකු විසින් ගත හැකි දරුණුම ක්‍රියා මාර්ගය වන අතර මෙය උපකාර කර ගත යුත්තේ අනෙක් සියළුම හැසිරීම් කළමණාකරණ ක්‍රියාමාර්ගයන් ගැනීමෙන් අනතුරුව පමණි. නෙරපා දැමීම පමණක් ඇති එකම ක්‍රියාවලිය වීමට තරම් සිසුවාගේ හැසිරීම ඉතා දරුණු විය යුතුය.

සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාවට දිගින් දිගටම සැලකිය යුතු ආකාරයේ සහ සත්‍යය තර්ජනයක් වන්නේ නම් සහ/හෝ පාසැලේ අධ්‍යාපන වැඩටහනේ කාර්යක්ෂමතාවය අපහසුතාවයකට පත්කිරීම වැනි සමහර අවස්ථානුගත කරුණු අනුව නෙරපා දැමීම යෝග්‍ය ක්‍රියා මාර්ගයක් විය හැකිය.

එක වරක් පමණක් සිදු කරන සමච්චලයක් (one-off prank) වැනි වෙනත් සිසුනට හෝ පාසැල් ප්‍රජාව හට හානියක් සිදු නොවන සිදුවීමක ප්‍රතිඵලයක් සම්බන්ධයෙන් නෙරපා දැමීම උපකාර කර ගත යුතු නැත.

### මාගේ දරුවාව නෙරපා දැමීමට පෙර විදුහල්පතිතුමා විසින් කුමන කරුණු සැලකිල්ලට ගෙන තිබේද?

සිසුවෙකුව නෙරපා දැමීමට පෙර විදුහල්පතිවරයෙකු විසින් පහත දේ කරන බවට වග බලා ගත යුතුය:

- සිසුවා හට කීමට ඇති දේ කීමට අවස්ථාව ලබාදුන් බව
- සිසුවා හෝ ඔවුන්ගේ අදාල පුද්ගලයා විසින් ලබාදුන් කිසියම් තොරතුරක් හෝ ලියවිල්ලක් ඇතිනම් (හැසිරීම් සමාලෝචන සම්මන්ත්‍රණය (Behaviour Review Conference) මගින් ඇතුළුව), නෙරපා දැමීම සම්බන්ධ තීරණය ගැනීමේදී ඒවා සැලකිල්ලට ගැනීම
- නෙරපා දමනු ලැබන සිසුවාගේ හැසිරීම සම්බන්ධයෙන් ගතහැකි වෙනත් ක්‍රියාමාර්ග සලකා බලා තිබීම.

### නෙරපා දැමීම සඳහා හේතු මොනවාද? මාගේ දරුවාගේ හැසිරීම නෙරපා දැමීමකට ප්‍රමාණවත් නොවන බව හැඟේ නම් මා විසින් කුමක් කල හැකිද?

නෙරපා දැමීම දරුණු හැසිරීම්වල ප්‍රතිඵල සම්බන්ධයෙන් පමණක් වෙන්කර තබාගත යුතුය. ඔබගේ දරුවා පාසැලේ සිටින අතර හෝ, පාසැලට පැමිණෙන හෝ පාසැලෙන් යන අතරතුර හෝ පාසැලෙන් පිටතදී පාසැල් ක්‍රියාකාරකමක නිරත වනවිට (එම ක්‍රියාකාරකමට යනවිට හෝ එම ක්‍රියාකාරකමින් පැමිණෙන විට ඇතුළුව), ඔවුන් පහත ආකාරයට හැසිරුණි නම් ඔවුන්ව නෙරපා දැමිය හැකිය -

**පහත ඕනෑම හැසිරීමක නිරතවීම:**

- සත්‍ය වශයෙන්, දැනෙන ආකාරයට හෝ තර්ජනය වන ආකාරයට ඕනෑම අයෙකුගේ සෞඛ්‍යයට ආරක්ෂාවට හෝ සුබසිද්ධියට අනතුරක් සිදුවන ආකාරයට හැසිරීමෂ
- දේපළවලට සැලකියයුතු ආකාරයට අලාභහානි කිරීම හෝ විනාශ කිරීමෂ
- දේපළ සොරකම් කිරීම හෝ එසේ කිරීමට උත්සාහ කිරීම හෝ දැනගෙනම එසේ කිරීමෂ
- නීතිවිරෝධී මත්ද්‍රව්‍ය හෝ ආයුධ ළඟ තබා ගැනීම, භාවිතය හෝ අළෙවි කිරීම හෝ වෙනත් අයෙකු හට සිතාමතාම ළඟ තබා ගැනීමට උපකාර කිරීමෂ
- කාර්ය මණ්ඩලය ලබාදුන් පැහැදිලි සහ සාධාරණ උපදෙස් අනුව කටයුතු කිරීමට අසමත්වීම මගින් සත්‍ය වශයෙන්, දැනෙන ආකාරයට හෝ තර්ජනය වන ආකාරයට ඕනෑම අයෙකුගේ සෞඛ්‍යයට ආරක්ෂාවට හෝ සුබසිද්ධියට අනතුරක් සිදුවන ආකාරයට හැසිරීමෂ
- වයසෂ දරුවෙකුට මව්කිරි දීමෂ ස්ත්‍රී පුරුෂබවෂ අනන්‍යතාවයෂ බෙලහීනතාවයෂ කාර්මික ක්‍රියාකාරකම්ෂ නීත්‍යානුකූල ලෙස කරන ලිංගික ක්‍රියාකාරකම්ෂ විවාහ අවිවාහක බවෂ මාපිය තත්වයෂ භෞතික ලක්ෂණෂ දේශපාලන විශ්වාසය හෝ ක්‍රියාකාරකම්ෂ ගර්බනීබවෂ ජාතියෂ ආගමික විශ්වාස හෝ ක්‍රියාකාරකම්ෂ ලිංගික හැඩගැස්මෂ යන කරුණු මත වෙනත් පුද්ගලයෙකු දිගින් දිගටම අපකීර්තියට පත් කිරීම, අපවාද කිරීම හෝ ලැජ්ජාවට පත් කිරීම

*හෝ අදාල පුද්ගලයා. අදාල පුද්ගලයෙකු හඳුනා ගැනීම (Identifying a Relevant Person) සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා පහත වෙබ් අඩවිය බලන්න: www.education.vic.gov.au/school/principals/participation/Pages/relevantperson.aspx

යන ආකාරයට හැසිරීම෴ ඉහත ගති ලක්ෂණ ඇති ලෙස හඳුනාගත් අයෙකු සමග පුද්ගලික ඇසුර (නැයෙකු හෝ වෙනත් ආකාරයට)෴

- වෙනත් ඕනෑම සිසුවෙකුගේ සුබසිද්ධිය, ආරක්ෂාව හෝ අධ්‍යාපනික අවස්ථාවලට බලපාන ආකාරයට නිරන්තරයෙන් නිෂ්ඵල ලෙස හැසිරීම.

**සහ**

සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ සෞඛ්‍යය, ආරක්ෂාව සහ සුබසිද්ධිය පවත්වා ගැනීමේ අවශ්‍යතාවය සහ පාසැලේ අධ්‍යාපන වැඩටහන කාර්යක්ෂමතාව පවත්වා ගැනීමේ අවශ්‍යතාවය සමග ඔබගේ දරුවා විසින් අධ්‍යාපනය ලැබීමට ඇති අවශ්‍යතාවය සන්සන්දනය කිරීමේදී, ඔබගේ දරුවාගේ හැසිරීමේ ආකාරය අනුව, ඇති එකම ක්‍රියා මාර්ගය නෙරපා දැමීම බව සලකනු ලැබීම.

සෑම පාසැලක් සතුවම පාසැල් ප්‍රජාව මගින් සිසුන්ගේ සහභාගිත්වය, ගෞරවනීය හැසිරීම සහ පාසැලට පැමිණීම ආදී ක්ෂේත්‍රවල බෙදාහදාගත් අපේක්ෂාවන් දැක්වූ සිසු සහභාගිත්ව ප්‍රතිපත්තියක් (Student Engagement Policy) තිබීම අපේක්ෂා කරන අතර එක් එක් සිසුන්ගේ අවස්ථානුගත කරුණු සම්බන්ධයෙන් පාසැල ප්‍රතිචාර දක්වන ආකාරය සම්බන්ධයෙන් මේ මගින් මග පෙන්වීමක් ලබාදේ.

ඔබ විසින් පාසැලේ *සිසු සහභාගිත්ව ප්‍රතිපත්තිය* ඇතුලත් පිටපතක් ලබාදෙන ලෙස පාසැලෙන් ඉල්ලා සිටිය හැකිය, නැතහොත් ඔවුන්ගේ වෙබ් අඩවියෙන් ලබාගත හැක. මෙම ප්‍රතිපත්තිය මගින් ඔබගේ පාසැල තුල හැසිරීම සම්බන්ධයෙන් ඇති අපේක්ෂාවන් දක්වා ඇති අතර මෙම අපේක්ෂාවන් බිඳදමා ඇතිද යන්න නිර්ණය කිරීමට මෙය හොඳ යොමුවකි. www.education.vic.gov.au/school/principals/participation/Pages/engagepol.aspx

නෙරපා දැමීමේ කාර්‍යාවලියේදී හෝ නෙරපා දැමීම ක්‍රියාත්මක කිරීමට පසුව වුවද, ඕනෑම අවස්ථාවකදී ඔබ හට විදුහල්පතිවරයා සමග රැස්වීමකට සහභාගි විය යුතු බවට ඉල්ලා සිටිය හැකිබව මතක තබා ගැනීම වැදගත්වේ. ඔබට ඇති ගැටළු හොඳින් සලකා බලා නොමැති බව ඔබට හැගේනම්, ඔබට ආසන්නයේම ඇති දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්‍යාලයේ සිටින ප්‍රජා සම්බන්ධීකරණ නිලධාරියා (Community Liaison Officer) හෝ මෙම පොත් පිංච අවසානයේ දක්වා ඇති උපකාරක සේවා සමග සම්බන්ධවන්න.

## පාසැල විසින් මා හට කුමන ලියකියවිලි ලබාදිය යුතුද?

හැසිරීම් සමාලෝචන සම්මන්ත්‍රණය අවසානවී පැය 48ක් ඇතුලත විදුහල්පතිතුමා විසින් ඔබට සහ ඔබගේ දරුවාට ඔවුන්ගේ තීරණය දැනුම් දිය යුතුය.

විදුහල්පතිවරයා විසින් ඔබගේ දරුවාව නෙරපා දැමීමට තීරණය කලහොත්, ඔබ හට පහත ලියකියවිලි ලබා දිය යුතුය:

- *නෙරපා දැමීමේ දැන්වීම* (Notice of Expulsion)
- *නෙරපා දැමීම සම්බන්ධ අභියාචන ෆෝරමයේ* (Expulsion Appeal Form) පිටපතක්.
- මෙම පොත් පිංච.

## නෙරපා දැමීමකින් පසු කුමක් සිදුවේද? මාගේ දරුවා කුමන පාසැලට යන්නේද?

අනිවාර්‍යයෙන් පාසැල් යා යුතු වයසේ සිටින දරුවෙකු සම්බන්ධයෙන් නම්, ප්‍රාදේශීය කාර්‍යාලය වෙතින් උපදෙස් ලබාගෙන විදුහල්පතිතුමා විසින් ඔබගේ දරුවාව, වෙනත් ලියාපදිංචි පාසැලකට ඇතුලත් කරන බවට෴ ලියාපදිංචි පුහුණු සංවිධානයකට ඇතුලත් කරන බවට෴ හෝ ප්‍රායෝගිකව හැකි විගස රැකියාවක නිරත කරවන බවට෴ වග බලා ගත යුතුය. මෙම ක්‍රියා සැලැස්ම හැසිරීම් සමාලෝචන සම්මන්ත්‍රණයේදී සාකච්ඡාකර එකගතාවයකට පත්වී සිටිය යුතුය.

අනිවාර්‍යයෙන් පාසැල් යා යුතු වයසේ නොමැති දරුවෙකු සම්බන්ධයෙන් නම්, ප්‍රාදේශීය කාර්‍යාලය වෙතින් උපදෙස් ලබාගෙන විදුහල්පතිතුමා විසින් ඔබට සහ ඔබගේ දරුවාට වෙනත් පාසැල්, ලියාපදිංචි පුහුණු සංවිධාන සහ ඔබගේ දරුවා හට සුදුසු අවස්ථා ලබාදෙන රැකියා ඒජන්සි සම්බන්ධ තොරතුරු ලබාදිය යුතුය.

ඔබගේ දරුවාව නව අධ්‍යාපන හෝ පුහුණු අවස්ථාවලට යොමු කරන කාලය අතරතුර ප්‍රමාදයක් ඇතිවන්නේ නම්, මෙම අතරතුර කාලයේදී සම්පූර්ණ කිරීමට පාසැල විසින් දරුවා හට අර්ථවත් වැඩ ලබාදිය යුතුය.

## මාගේ දරුවාව නෙරපා දැමීම මා විසින් අභියාචනා කල හැකිද?

නෙරපා දැමීම් පාලනය කරන *625 දරණ අමාත්‍ය නියෝග* (Ministerial *Order 625*) මගින් සිය නෙරපා දැමීම අභියාචනා කිරීමට සිසුවාට බලය ලබාදේ.

ඔබ ඔබගේ දරුවාගේ අදහස් සැලකිල්ලට ගෙන ඔබ ඔබගේ දරුවාගේ උපරිම සුභසිද්ධිය වෙනුවෙන් කටයුතු කරන තාක් දුරට ඔබ විසින් ඔබගේ දරුවා වෙනුවෙන් අභියාචනය කල හැකිය.

අභියාචනයක් පහත පදනම් මත යොමු කල හැකිය:

- පාසැල විසින් නෙරපා දැමීමේ කාර්‍යාවලියට අනුව කටයුතු නොකර තිබීම
- නෙරපා දැමීම සම්බන්ධ හේතු අසාධාරණ ලෙස සැලකීම
- සිසුවා හට හැසිරීම් සම්බන්ධ ගැටළු සහිත ඉතිහාසයක් තිබී, ඒ සම්බන්ධ ප්‍රමාණවත් මැදිහත්වීම් සහ උපාය මාර්ගයන් ගෙන නොතිබීම
- වෙනත් වරදකාරිත්වය අඩු කරන සාධක තිබීම

ඔබගේ දරුවාව නෙරපා දැමීම සම්බන්ධ දැන්වීම ඔබට ලබාදෙන විට ඔබට අභියාචන පෝරමයක්ද ලබාදිය යුතුය. ඔබ අභියාචනා කිරීමට අදහස් කරන්නේ නම්, මෙම පෝරමය සම්පූර්ණ කර දින 10ක් ඇතුලත ඔබගේ දරුවාගේ පාසැල වෙත යැවිය යුතුය. මෙය පාසැල වෙත ලැබුණු බවට වග බලා ගැනීමට ඔබ දරුවාගේ පාසැල සමග සම්බන්ධවන ලෙස අපි නිර්දේශ කරමු.

## නෙරපා දැමීමේ අභියාචනයකදී කුමක් සිදුවේද?

නෙරපා දැමීම සම්බන්ධ අභියාචනා පෝරමය පාසැල වෙත ලැබීමෙන් අනතුරුව, වැඩිදුර කටයුතු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ඇත.

ප්‍රාදේශීය අධ්‍යක්‍ෂවරයා විසින් ඔබගේ අභියාචනය සලකා බලන අතර ඔබගේ දරුවාව නෙරපා දැමීමට ගත් තීරණය සනාථ කරනවාද නැතිනම් වෙනස් කරනවාද යන්න නිර්ණය කරනු ඇත.

ඔබගේ අභියාචනය සලකා බැලීමේදී, ඔබගේ දරුවාට අදාල කටයුත්ත සමාලෝචනය කිරීමට ප්‍රාදේශීය අධක්‍ෂකවරයා විසින් නෙරපා හැරීම් සමාලෝචන මඩුල්ලක් (Expulsion Review Panel (ERP)) පත්කල හැකිය.

ERP පත්කර ඇතිනම්, එහි කාර්යභාරය වන්නේ:

- ඔබට සහ ඔබගේ දරුවාට ඇති දේ කීමට අවස්ථාවක් ලබාදීමෂ සහ
- ඔබගේ දරුවාව නෙරපා දැමීමට ගත් තීරණය සනාථ කිරීමට හෝ වෙනස් කිරීමට ප්‍රාදේශීය අධ්‍යක්‍ෂකවරයා හට උපකාර කිරීම සඳහා වාර්තාවක් සකස් කිරීම.

මෙම ක්‍රියාවලිය සම්බන්ධ වැඩිපුර විස්තර සඳහා විනය ක්‍රියාමාර්ග (Disciplinary Measures) කොටස වෙත පිවිසෙන්න:
www.education.vic.gov.au/school/principals/participation/Pages/studengage.aspx

## අභියාචනයක් යොමුකලහොත්, අවසාන තීරණයක් ලැබෙන තෙක් මාගේ දරුවා කුමක් කරනු ඇතිද?

හැසිරීම් සම්බන්ධ සමාලෝචන සම්මන්ත්‍රණයේදී නිර්ණය කල අන්තර්කාල සැලැස්ම (ටරඅනසඉටඉඔන පලඅන) ඔබගේ දරුවාගේ පාසැල මගින් දිගටම ක්‍රියාත්මක කල යුතුය. හැසිරීම් සම්බන්ධ සමාලෝචන සම්මන්ත්‍රණ සම්බන්ධ වැඩි විස්තර සඳහා පහත වෙබ් අඩවිය බලන්න:
www.education.vic.gov.au/school/parents/behaviour/Pages/faqs.aspx

අනිවාර්යයෙන් පාසැල් යා යුතු වයසේ සිටින සිසුවෙකු සම්බන්ධයෙන්, මෙයට පාසැල මගින් ඔබගේ දරුවා වෙනත් අධ්‍යාපන, පුහුණු හෝ රැකියා අවස්ථාවක් වෙත යනතෙක් හෝ නෙරපා දැමීමේ අභියාචනය තීරණය කරන තෙක් (දෙකින් කලින් අවසන්වන එක තෙක්) දිගටම යෝග්‍ය වැඩ ලබාදීම ඇතුලත්වේ.

අනිවාර්යයෙන් පාසැල් යා යුතු වයසේ නොමැති දරුවෙකු සම්බන්ධයෙන් නම්, විදුහල්පතිතුමා විසින් ඔබට සහ ඔබගේ දරුවාට වෙනත් පාසැල්, ලියාපදිංචි පුහුණු සංවිධාන සහ ඔබගේ දරුවා හට සුදුසු අවස්ථා ලබාදෙන රැකියා ඒජන්සි සම්න්ධ තොරතුරු ලබාදිය යුතුය.

ක්‍රියා මාර්ගය ක්‍රියාත්මක කිරීම හෝ ඔබගේ දරුවාට ලබාදෙන වැඩ සම්බන්ධයෙන් ඔබට යම් කනස්සල්ලක් ඇතිනම්, මෙය ඔබගේ දරුවාගේ පාසැලේ විදුහල්පතිවරයා සමග හෝ ප්‍රාදේශීය කාර්යාලය සමග තවදුරටත් සාකච්ඡා කල යුතුය.

## තීරණයක් ගත් පසු කුමක් සිදුවේද?

ඔබගේ දරුවාව නෙරපා දැමීමේ තීරණය සනාථ කලහොත්, තීරණය ගත් අවස්ථාවේ සිට පැය 24ක් ඇතුලත ඔබ හට වාචිකව දැනුම් දෙනු ඇත.

ඔබගේ දරුවාව නෙරපා දැමීමට විදුහල්පතිවරයා විසින් ගත් තීරණය ප්‍රාදේශීය අධ්‍යක්‍ෂකවරයා විසින් සනාථ කලහොත්, විදුහල්පතිවරයා විසින් පහත පියවර ගත යුතුය:

**අනිවාර්ය පාසැල් වයසේ සිටින සිසුවෙකු සම්බන්ධයෙන් නම්**

- සිසුවාව වෙනත් පාසැලකට, ලියාපදිංචි පුහුණු සංවිධානයකට, හෝ රැකියාවකට යන කාලය අතරතුර ක්‍රියාත්මක සැලැස්ම දිගටම ක්‍රියාත්මක කිරීම
- සිසුවාව වෙනත් පාසැලකට, ලියාපදිංචි පුහුණු සංවිධානයකට, හෝ රැකියාවකට යාම අවසාන වන තුරු සිසුවා හට යෝග්‍ය වැඩ ලබාදීම.

**අනිවාර්යයෙන් පාසැල් යායුතු වයසට වැඩි අයෙකු සම්බන්ධයෙන් නම්**

විදුහල්පතිතුමා විසින් සිසුවාට සහ අදාල පුද්ගලයාට වෙනත් පාසැල්, ලියාපදිංචි පුහුණු සංවිධාන සහ ඔබගේ දරුවා හට සුදුසු අවස්ථා ලබාදෙන රැකියා ඒජන්සි සම්න්ධ තොරතුරු ලබාදෙන බවට වගබලා ගත යුතුය.

විදුහල්පතිවරයා විසින් ඔබගේ දරුවාව නෙරපා දැමීමට ගත් තීරණය ප්‍රාදේශීය අධ්‍යක්‍ෂකවරයා විසින් වෙනස් කලහොත්, විදුහල්පතිවරයා විසින් හැකි විගස පහත ක්‍රියාමාර්ගයන් ගත යුතුය:

- සිසුවාව පාසැලට නැවත ඇතුලත් කල යුතුය
- සිසුවා, අදාල පුද්ගලයා සහ සිසුවාගේ ගුරුවරුන් සමග එක්ව විදුහල්පතිවරයා විසින් නැවත පාසැල වෙතට යාමේ සැලැස්මක් (Return to School Plan) පිළියෙල කල යුතුය.
- සිසුවාගේ ස්ථිර වාර්තාවලින් සහ ඡෘ21 වෙතින් නෙරපා දැමීම සම්බන්ධ වාර්තාව ඉවත් කල යුතුය
- සිසුවාගේ වාර්තාවලින් නෙරපා දැමීම ඉවත්කල බව සිසුවා සහ අදාල පුද්ගලයා හට ලිඛිතව දැනුම් දිය යුතුය.

## වැඩිදුර විස්තර සහ උපකාර කෙසේ ලබාගත හැකිද?

සිසු සහභාගිත්ව සහ අන්තර්ගත කිරීමේ මාර්ගෝපදේශය (Student Engagement and Inclusion Guidance) මගින් නෙරපා දැමීමක් ක්‍රියාත්මක කිරීමේදී විදුහල්පතිවරුන් විසින් අනුගමනය කලයුතු ක්‍රියා මාර්ගය දැක්වේ. මෙම මාර්ගෝපදේශය මෙතනින් ලබාගත හැකිය:

www.education.vic.gov.au/school/principals/participation/Pages/studengage.aspx

අත්හිටුවීම සහ නෙරපීම සම්බන්ධව දෙමාපියන් විසින් නිතර අසන ප්‍රශ්න (FAQs) පහත වෙබ් අඩවියේ ඇත:

www.education.vic.gov.au/school/parents/behaviour/Pages/faqs.aspx

මුලින්ම, ඔබගේ පළාතේ ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රජා සම්බන්ධීකරණ නිලධාරියා (Community Liaison Officer) හා සම්බන්ධ විය යුතුය (සම්බන්ධවීමේ තොරතුරු පහත ඇත).

## අධ්‍යාපන සහ බාල ළමාවිය සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්යාලය

### ඊසානදිග වික්ටෝරියානු කලාපය (NORTH EASTERN VICTORIA REGION)

ඊමේල්: nevr@edumail.vic.gov.au

**බෙනලා**

තැපැල්: PO Box 403, Benalla, Victoria 3672
ස්ථානය: 150 Bridge Street East, Benalla, Victoria 3672
දුරකථනය: (03) 5761 2100
ෆැක්ස්: (03) 5762 5039

**ග්ලෙන් වෙවර්ලි**

ස්ථානය: Level 3, 295 Springvale Road, Glen Waverley 3150, Victoria
දුරකථනය: (03) 9265 2400
ෆැක්ස්: (03) 9265 2444

### වයඹදිග වික්ටෝරියානු කලාපය (NORTH WESTERN VICTORIA REGION)

ඊමේල්: nwvr@edumail.vic.gov.au

**බෙන්ඩිගෝ**

තැපැල්: PO Box 442, Bendigo, Victoria 3552
ස්ථානය: 7-15 McLaren Street, Bendigo, Victoria 3550
දුරකථනය: (03) 5440 3111
ෆැක්ස්: (03) 5442 5321

**කෝබර්ග්**

තැපැල්: Locked Bag 2001, Coburg, VIC 3058
ස්ථානය: Level 2, 189 Urquhart Street, Coburg, VIC 3058
දුරකථනය: (03) 9488 9488
ෆැක්ස්: (03) 9488 9400

### ගිනිකොනදිග වික්ටෝරියානු කලාපය (SOUTH EASTERN VICTORIA REGION)

ඊමේල්: sevr@edumail.vic.gov.au

**ඩැංඩිනොංග්**

තැපැල්: PO Box 5, Dandenong 3175
ස්ථානය: 165-169 Thomas Street, Dandenong 3175
දුරකථනය: (03) 8765 5600
ෆැක්ස්: (03) 8765 5666

**මෝ**

තැපැල්: PO Box 381, Moe, Victoria 3825
ස්ථානය: Corner Kirk and Haigh Streets, Moe, Victoria 3825
දුරකථනය: (03) 5127 0400
ෆැක්ස්: (03) 5126 1933

### නිරිතදිග වික්ටෝරියානු කලාපය (SOUTH WESTERN VICTORIA REGION)

ඊමේල්: swvr@edumail.vic.gov.au

**බැලරාට්**

ස්ථානය: 109 Armstrong Street North, Ballarat, 3350
දුරකථනය: (03) 5337 8444
ෆැක්ස්: (03) 5333 2135

**වෙස්ට් ෆුට්ස්ක්‍රේ**

ස්ථානය: Level 3, Whitten Oval, 417 Barkly Street, West Footscray, 3012 *(ඇතුළුවීම පැත්තට තල්ලුකරන වීදුරු දොර ඔස්සේ)*
දුරකථනය: (03) 9291 6500
ෆැක්ස්: (03) 9291 6565

**ජීලොන්ග්**

තැපැල්: PO Box 2086, Geelong, Victoria 3220
ස්ථානය: 5A Little Ryrie Street, Geelong, Victoria 3220
දුරකථනය: (03) 5225 1000
ෆැක්ස්: (03) 5225 1099

## අමතරව ලබාගත හැකි උපකාර

### පේරන්ට්ලයින් වික්ටෝරියා (Parentline Victoria)

දුරකථනය: 13 22 89 – පෙව 8 සිට මධ්‍යම රාත්‍රී වන තෙක් සතියට දින 7ක්

*පේරන්ට්ලයින් මගින් උපන්දා සිට වයස අවුරුදු 18 වන තෙක් දරුවන්ගේ දෙමාපියන් සහ රැකවරණකරුවන් හට මුළු ප්‍රාන්තය පුරා දුරකථන උපදේශක සේවාවක් ලබාදේ.*

### පේරන්ට්ස් වික්ටෝරියා (Parents Victoria)

දුරකථනය: (03) 9380 2158 හෝ 1800 032 023 (ග්‍රාමීය ඇමතුම්කරුවන් හට පමණ)

වෙබ් අඩවිය: www.parentsvictoria.asn.au

### වික්ටෝරියානු ඇබොරිජිනල් අධ්‍යාපන සංගමය (Victorian Aboriginal Education Association Inc. )

දුරකථනය: (03) 9416 3833

වෙබ් අඩවිය: www.vaeai.org.au

### ළමා සහ යොවුන් විය මානසික සෞඛ්‍යය සේවා (Child and Adolescent Mental Health Services)

දුරකථනය: 1300 767 299

වෙබ් අඩවිය: www.health.vic.gov.au/mentalhealth/services/child/

### ළමා ආරක්‍ෂණ සමිතිය (Children's Protection Society)

දුරකථනය: (03) 9450 0900

වෙබ් අඩවිය: www.cps.org.au

### ඕස්ට්‍රේලියානු ළමාවිය සම්බන්ධ පදනම (Australian Childhood Foundation)

දුරකථනය: (03) 9874 3922

වෙබ් අඩවිය: www.childhood.org.au/website/default.asp

### වික්ටෝරියාවේ පාසැල් කවුන්සිල් සංගමය (Association of School Councils in Victoria)

දුරකථනය: (03) 9808 2499

වෙබ් අඩවිය: www.asciv.org.au/ASCIV/Welcome.html

### පාසැල් සංවිධාන සම්බන්ධ වික්ටෝරියානු කවුන්සිලය (Victorian Council of School Organisations)

දුරකථනය: (03) 9429 5900

වෙබ් අඩවිය: www.viccso.org.au/

### වික්ටෝරියානු බහුසංස්කෘතික කොමිසම (Victorian Multicultural Commission)

දුරකථනය: (03) 9208 3184

වෙබ් අඩවිය: www.multicultural.vic.gov.au/